ඉඳි කෝටුවක් විය. නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා ඒ මත වූහ. -එනම් කුත්බා දේශනයේදීය- මින්බර් මත එතුමා තබන කල්හි, ගැබ්බරවූ ඔටු දෙනකුගේ හඬට සමාන ඉඳි කෝටුවේ හඬට අපි සවන් දුනිමු. නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා පහළට බැස ඒ මත එතුමා තම අත තැබූහ. එවිට එය සන්සුන් විය.

ජාබිර් ඉබ්නු අබ්දුල්ලාහ් -රළියල්ලාහු අන්හුමා-තුමා විසින් වාර්තා කරන ලදී. කුත්බා දේශනයේදී නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා ඒ මත රැඳී සිටින ඉඳි කොටය(කින් වූ වේදිකාව)ක් විය. එම මින්බරය තබනු ලැබූ විට ගැබ්බරවූ ඔටුවකුගේ හඬට සමාන හඬක් එම කොටයෙන් සවන් දුනිමු. එය නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- පහළට බසින තෙක්ම විය. පසුව එතුමා ඒ මත තම අත තැබූහු. එවිට එය සන්සුන් විය. තවත් වාර්තාවක. ජුමුආ දින පැමිණි විට නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා මින්බරය මත වාඩි වූහ. එතුමා දේශනා කරමින්
සිටිය දී එතුමා අබියස පිහිටි ඉඳි කොටයක් එය පැළී යන්නාක් තරමට හඬ නගන්නට විය. පසුව
නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා බැස එය රැගෙන එය තමන් සමග තුරුල් කර ගත්හ.
වැටුණු දරුවකු කෙඳිරි ගාන්නාක් මෙන් එය නිකුත් කළ කෙඳිරිය සන්සුන් වන තෙක්ම නිහඬ කරවන්නට විය. එතුමා: එය උපදෙසට සවන් දුන් කරුණු සඳහා හඬන්නට විය යැයි පැවසූහ.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් බුහාරි එය වාර්තා කර ඇත]

නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා තම වේදිකාව වශයෙන් ඉඳි කොටයක් අරගත්හ. නබි - සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා එහි යොමු වූ කල්හි එම කොටයේ හඬට සවන් දුන්හ. එය අඬන්නට වූයේ, උපදෙස තුළින් එය සවන් දුන් කරුණු හේතුවෙනි.

http://www.sunnah.global/hadeeth/si/show/4927